# 05. අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය හා වාරි කර්මාන්තය

පී.බී.අයි.කේ. කුසුම්ලතා

## හැඳින්වීම

ඓතිහාසික මූලාශ්‍රයන්හි සඳහන් වන පරිදි අනුරාධපුර නගරය ආරම්භ වී ඇත්තේ ක්‍රිස්තු පූර්ව 05 සියවසේහි ය. කෙසේ වෙතත් ක්‍රිස්තු පූර්ව 04 වන සියවසෙහි පණ්ඩුකාභය රජතුමා අනුරාධපුරය අගනගරය බවට පත් කර ගන්නා අතර එය මනා සංවිධිත සැලසුමක් අනුව සංවිධානය කරන ලදී. මෙලෙස ආරම්භ වුන අනුරාධපුර නගරය වසර ගණනාවක් නොයෙක් පාලකයන් යටතේ පාලනය විය. ඉතා සංවර්ධිත වූ අනුරාධපුර යුගය අවසාන භාගයේදී දිගින් දිගටම දකුණු ඉන්දීය ආක්‍රමණ වලට ලක් විය. මේ හේතුවෙන් අවසානයේ දී ක්‍රිස්තු වර්ෂ 1017 දී අනුරාධපුර නගරය අතහැර දැමීය. මෙම දැවැන්ත නගරය ක්‍රි.පූ. 05 වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 1017 දක්වා ලංකාවේ අගනගරය ලෙස පැවතුණි. එහි පසුබැස්ම ඇරඹියේ දකුණු ඉන්දීය ආක්‍රමණයන්ට එරෙහිව දිගින් දිගටම යුධ වැදීම හේතුවෙන් ඇතිවූ රාජධානියේ ආර්ථිකමය දුශ්කරතා නිසා ය. කෙසේ වෙතත් ක්‍රිස්තු වර්ෂ 1017 දී විදේශ ආක්‍රමණ හා තවත් විවිධ හේතූන් නිසාවෙන් මෙය බිඳ වැටීමට ලක් විය. මෙම කාල සීමාව තුළ සමාජීය වශයෙන් විවිධ පැතිකඩයන් යටතේ නොයෙක් අංශ එනම් ආර්ථිකමය, දේශපාලනික, සංස්කෘතික, ආගමික හා සමාජ සිරිත් විරිත් ආදිය මුල්කර ගත් සමාජ සංවර්ධනයක් ඇති විය.ඒ සඳහා එක් ප්‍රබල සාධකයක් වූයේ අනුරාධපුර තදාශ්‍රිත ප්‍රදේශයේ ඇති වූ වාරි කර්මාන්තයන්හි සංවර්ධනයයි. මේ යුගයේ වාරි කර්මාන්තයන් කෙතරම් වැදගත් වේදයත් සෑම පාලකයෙකුම පාහේ ඒ කෙරෙහි අවධානය යොමු කිරීමට අමතක නොකළහ. ඒ අනුව පණ්ඩුකාභය රජුගේ පටන් අනුරාධපුර යුගය අවසානය තෙක් ම විවිධ පාලකයන් යටතේ වාරි කර්මාන්තයන් රාශියක් නිර්මාණය වී තිබේ. අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කෙරෙහි වාරි කර්මාන්තය දායක වී ඇති අතර ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි දී සිදු කරනු ලැබේ.

අනුරාධපුර යුගය ආරම්භ වූයේ කෙසේ ද එහි වර්ධනය මෙන්ම අවසානය පිළිබඳව යම් අවබෝධයක් ලබා ගැනීම, එකල සමාජ සංවර්ධනය වූයේ කෙලෙසද සහ කෙතෙරම් දුරට එහි සාර්ථකත්වයක් දැකගත හැකි වී ද යන්න අවබෝධ කර ගැනීම, අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තයන් පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීම මෙන්ම එකල වාරි කර්මාන්ත මඟින් සමාජ සංවර්ධනය සඳහා සැපයූ දායකත්වය කෙබඳු ද යන්න විමසා බැලීමත්, අනුරාධපුර සමාජ සංවර්ධනය හා වාරි කර්මාන්ත යන මැයෙන් සාර්ථක අධ්‍යයනයක් සිදු කර ඒ හා දැනුම සොයන්නට තොරතුරු ලබා ගැනීමට මෙහෙයක් වීම ආදී එකී අරමුණු මුදුන්පත් කර ගැනීමේ පරමාර්ථයෙන් මෙම අධ්‍යනය සිදු කරනු ලැබේ.

## ක්‍රමවේදය

අධ්‍යයනයේ දී තොරතුරු දත්ත රැස් කිරීමෙන් ලබාගත් අතර මූලික දැනුම ලබා ගැනීමට හා පෙර සූදානම සඳහා පුස්තකාල ගවේශණය මඟින් තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදී. එසේම මෙම අධ්‍යයනයට දත්ත, ඡායාරූප හා සැලසුම් පිළිබඳව අවබෝධයට හා විවිධ තොරතුරු ලබා ගැනීමට විවිධ වෙබ් අඩවි තුළ පල වී ඇති සඟරා, පර්යේෂණ වාර්තාවන් අධ්‍යයනය කර තොරතුරු ලබා ගැනීමට කටයුතු කරනු ලැබීය. සාහිත්‍යමය මූලාශ්‍රයන්ට අමතරව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් ද වැදගත් වන අතර අනුරාධපුර සමාජීය වශයෙන් පැවති හා පවතින සාදක මත මෙන්ම වාරි කර්මාන්තයන්හි නටබුන් ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් එකී ඡායාරූප අධ්‍යයනයට පෙළඹුණි.

අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධන හා වාරි කර්මාන්තයන් පිළිබඳව පූර්ණ වශයෙන් අධ්‍යයනයකට යොමු වීමෙන් ඉහත කරුණු සාක්ෂාත් කර ගැනීමටත් ඉතා සාර්ථක අධ්‍යයනයක් ලෙස නිමා කිරීමටත් බලාපොරොත්තු වේ. එසේ අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කෙබඳු ආකාරයේ දියුණුවක් දැකගත හැකි වූයේ ද යන්නත් එකී සමාජ සංර්ධනය වාරි කර්මාන්තය හා දක්වන සම්බන්ධතාවය පිළිබඳ වටහා ගැනීමටත් හැකි වනු ඇත.

**විමර්ශනය**

ලංකාවේ බිහි වූ ප්‍රථම සංවිධානාත්මක රාජධානිය වූ අනුරාධපුරය වසර ගණනාවක් විවිධ පාලකයන් යටතේ පාලනය විය. අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී සෑම සමාජයේ සෑම අංශයකම දියුණුවක් එනම් දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා ආගමික වශයෙන් සමාජ සංවර්ධනයක් දැක ගත හැකි විය. අනුරාධපුර යුගයේ ප්‍රථම පාලකයා වූයේ පණ්ඩුකාභය රජු ය. ඔහු යටතේ දේශපාලන දියුණුව පමණක් නොව ආර්ථික වශයෙන්, සංස්කෘතික හා ආගමික වශයෙන් සමාජයේ සංවර්ධිත අවධියන් කරා ගෙන යනු ලැබී ය. සමාජ සංර්ධනයේ දී මොහු වාරි කර්මාන්තයන් ත්‍රිත්වයක් ඉදි කිරීමෙන් සමාජ සංවර්ධනයේ දියුණුවට මං විවර කරනු ලැබීය. මෙලෙස ආරම්භ වී පාලනය ගෙන යාමෙන් අනතුරුව බොහෝ පාලකයන් යටතේ අනුරාධපුරය මුල් කරගෙන බලය හසුරුවනු ලැබීය. ඔවුන් එක් එක් කාල පරිච්ඡේදයන් තුල වාරි කර්මාන්තය දියුණු කරමින් මෙන්ම ඉදිකරමින් සමාජ සංවර්ධනයට අවැසි දායකත්වය සපයනු ලැබීය.

අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය පිළිබඳව අධ්‍යයනය දී ආර්ථික දියුණුව ඉතා වැදගත් වූ අතර ඒ සඳහා වාරි කර්මාන්තයන්ගේ දායකත්වය ඉවහල් ව ඇත. මෙකල සමාජයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ කෘෂිකර්මාන්තය යි. ආර්ථිකයේ පදනම වූයේ එයයි. කෘෂිකර්මාන්ත කටයුතු සඳහා ජලය අත්‍යාවශ්‍ය සාධකයක් වන හෙයින් වාරි කටයුතුවල නියැලීමට සෑම පාලකයෙකුම පාහේ වෙහෙස විය. විජය ඇතුළු පිරිස ලංකාවට ගොඩබැසීමෙන් අනතුරුව වාසය කිරීමට ගංගා ආශ්‍රිත ප්‍රදේශ තෝරා ගනු ලැබීය. ක්‍රමයෙන් රජවරු බලයට පත් වූ විට රජවරු යටතේ වාරි කර්මාන්තයන් සංවර්ධනය විය. අනුරාධපුර ප්‍රථම පාලකයා ලෙස සලකනු ලබන පණ්ඩුකාභය රජුගේ සිට අවසාන සමය වන තෙක් ම පාලකයන් යටතේ වාරි කර්මාන්තයන් නිර්මාණය විය. ඊට උදාහරණ වශයෙන් පණ්ඩුකාභය රජුගේ අභය වැව, බසවක්කුලම වැව, වසභ රජතුමා (ක්‍රිස්තු වර්ෂ 67-111) මධ්‍ය ප්‍රමාණයේ වැව් තැනීමේ ආරම්භක පාලකයාය. වාරි නිර්මාණ සඳහා මුල්වරට විශාල වශයෙන් රාජ්‍ය අනුග්‍රහය විය.ඔහු වැව් 11ක් හා ඇළ මාර්ග 12ක් නිර්මාණය කළේය. මහසෙන් රජතුමා විශාලම වැව් තැනීමේ ආරම්භක පලකයා වශයෙන් සැලකේ. ඔහු වැව් 16 ක් හා ඇළ මාර්ගයන් නිර්මාණය කලේය. ධාතුසේන රජතුමාගේ කාල පරිච්ඡේදය අනුරාධපුර වාරි කර්මාන්ත ඉතිහාසයෙහි සංවර්ධිතම අවධිය යි. ඔහු යටතේ මහා වැව් 18 ක් හා ඇළ මාර්ග කිහිපයක් ද නිර්මාණය විය. මෙකී පාලකයන්ට අමතරව දේවානම්පියතිස්ස, සද්ධා තිස්ස, කුටකණ්ණ තිස්ස, ජෙට්ඨ තිස්ස, පළමු අග්බෝ (571-604), දෙවන අග්බෝ (604-614) අදී මෙන්ම තවත් පාලකයන් රැසක් අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කිරීමෙහිලා වාරි කර්මාන්ත ඉදිකරමින් හා සංවර්ධනය කරමින් දායකත්වය සපයා තිබේ. මෙලෙස වාරි කර්මාන්තයන්ගේ ආරම්භය හා සංවර්ධනය සමඟ සමාජයට නව තනතුරු ද ඇති විය. එනම් වාරි කර්මාන්ත හා සම්බන්ධ නිලධාරීන් පිළිබඳ තොරතුරු මූලාශ්‍රගත සාධක ඇසුරෙන් අපට හඳුනාගත හැකි වේ. උදාහරණයක් ලෙස ***වපි හමික-ජල අධිපතියා*** වැනි තනතුරු පෙන්වා දිය හැකිය. මෙවන් වාරි කර්මාන්ත හා සම්බන්ධ තොරතුරු ශිලා ලේඛන, වංසකතා ගත තොරතුරු වල ද යම් යම් ආකාරයට ඇතුළත්ව ඇත. විවිධාකාරයෙන් ආර්ථිකය කෙරෙහි බලපෑම් කල වාරි කර්මාන්තය එකල වැවේ ජල පරිවහනය තුළ විවිධ බදු මුදල් අය කරනු ලබයි. ඒ අනුව, වැවේ සිටින මත්ස්‍යයන් හා ජලය වෙනුවෙන් එසේම කෘෂිකාර්මාන්තයට

හා අනෙකුත් ආර්ථික ක්‍රියාවලියන්ට ජලය දීම මගින් ආර්ථිකමය වශයෙන් දියුණුවක් ලැබීමට වාරි කර්මාන්තය ඉතා වැදගත් විය. ඒ අනුව අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කෙරෙහි වාරි කර්මාන්තය මගින් දියුණු වු ආර්ථිකයද ඉතා වැදගත් විය.

ලොව කිසිදු රටකට නොදැවිණි තාක්ෂණයකින් පරිපූර්ණ වාරි ක්‍රමවේදයක් මෙරට තුළ ක්‍රමයෙන් ස්ථාපිත වීම කෙරෙහි අනුරාධපුර ආරම්භයේ සිට අවසානය දක්වා සිදු වු ලාංකික වාරි කටයුතු හා බැඳි වාරි තාක්ෂණයේ සුවිශේෂී සිදුවීම් හා ලක්ෂණ ඉවහල් විය. ඒ අනුව සමාජ සංවර්ධනය කෙරෙහි එකී තාක්ෂණික බලපෑමද ඇති විය. වාරි කර්මාන්තයේ දියුණුවට කටයුතු කළ ශ්‍රේෂ්ඨයකු වූ වසභ රජු විසින් ඉදි කළ අනුරාධපුරයේ පිහිටි මහ හා කුඩා විලච්චිය, මාන්කැටිය, නොච්චිපොතාන, අක්වඩුන්න යන වැව් නූතනයේ ද දක්නට ලැබෙන අතර පූර්ණ මිනුම් හා පාඨාංක දක්නට නොමැති වුවත් ඒවා පුරාණ කාලයේ ඉදි කළා වූ වාරි කර්මාන්තවලට වඩා තාක්ෂණයෙන් දියුණු හා ප්‍රමාණයෙන් විශාල වුණු බව පෙනී යයි. ඇළ හැර ඇල ඉදි කිරීම අතිශය නිර්මාණාත්මක ක්‍රියාදාමයකි. මෙය අබන් ගඟේ ජලය හරස් කර බඳිනු ලැබුවක් වන අතර විශාල ප්‍රදේශයක් පෝෂණය කරමින් ගොස් අවසානයේ කිරිදි ඔයට සම්බන්ධ වේ. මෙහි ඇති උසස් තාක්ෂණය විද්වතුන් පෙන්වා දෙයි. මෙකී තාක්ෂණයට අමතරව අනුරාධපුර යුගයේ තවත් වාරි කර්මාන්තය හා බැඳි විවිධ තාක්ෂණික ක්‍රම දැක ගත හැකි විය. ඉහත සඳහන් කළ පරිදි විවිධ ශිල්ප ක්‍රමයන්ට උරුමකම් කී වැසියන් අනුරාධපුර යුගයේ වාසය කිරීම මගින් හා ඔවුන්ගේ දායකත්වය මගින් මහා වාරි නිර්මාණ බිහි වීමෙන් එකළ සමාජ සංවර්ධනය තවදුරටත් විද්‍යමාන වේ.


අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය හා සම්බන්ධ සංස්කෘතියක් මෙන්ම ආගමික කටයුතු, විවිධ චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත් ද සමාජයේ සංවර්ධනයට දායක වී තිබේ. ජල කළමණාකරණය වනාහි මෙරට සංස්කෘතියෙහි ප්‍රබල අවශ්‍යයතාවයකි. ජන ජීවිතයේ ප්‍රධාන ආහාරය වන්නේ බත්ය. එකී හේතුව මත මෙරට තුළ ජල කළමණාකරන සංස්කෘතික රටාවක් ගොඩනැගුණි. ආර්ථිකය කෘෂිකර්මාන්තය මත පදනම් වීමත් ප්‍රධාන ආහාරය බත් වීමත් වැව සමග සංස්කෘතිය පෝෂණය වීම කෙරෙහි බලපෑවේය. ඊට අමතරව රජු කෙරෙහි ගෞරවාන්විත භාවයක් භක්තියක් මෙන්ම ආදරයට පාත්‍ර වීමටද වාරි කර්මාන්තයන් ඉවහල් විය. ඇතැම් රජවරු දේවත්වයෙහිලා සලකනු ලැබේ. ඊට නිදසුනක් ලෙස ක්‍රිස්තු වර්ෂ 274 - 301 අතර කාලයේ රජකම් කළ මහසෙන් රජු ***මින්නේරි දෙවියන්*** හෙවත් ***හත් රජ්ජුරු බණ්ඩාර*** ලෙස ජනයා අතර ප්‍රසාදයට පාත්‍ර වී ඇත.

දිවයිනේ බහුතර ජනගහනය වු සිංහලයන්ගේ ශිෂ්ටාචාරය වාරිමාර්ග ක්‍රමෝපායන් මත රඳා පැවතුණි. මේ ක්‍රියාදාමය ඔස්සේ ආදි සිංහල ජනයා ස්වකීය ජල කළමනාකරණ ශක්‍යතාවය මත නිර්මිත වූ මුල් කාලීන ශිෂ්ටාචාරය තුළින් මානව වංශයේ විශිෂ්ඨ ස්ථාවරත්වයකට පත් විය. මෙම සම්ප්‍රදායේ එක් ලක්ෂණයක් වුයේ සිංහලයා සතුව තිබූ සංවර්ධිත වාරි තාක්ෂණික ඥානය වූ අතර අනෙක නම් ලෝකයේ විශ්මිත නිර්මාණයක් හා එක්බඳු වූ ඔවුන් නිමැවූ බෞද්ධ ස්මාරකයන් ය. ආගමික හා වාරි තාක්ෂණික යන උභයාංගයන් සංගෘහිතව නිපවුණු මෙම සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය වශයෙන් හැඳින්විය හැකිය. මේ සභ්‍යත්වයේ අභේද්‍ය වූ වැව හා දාගැබ සිංහල සංස්කෘතියේ සංකේතයන් ය. සිංහල වාරි සංස්කෘතිය පිළිබඳ බද්දේගම විමලවංශ හිමියන් මෙසේ සඳහන් කරති. ***"සිංහල සංස්කෘතිය හැඩගැසී ගියෙත් දියුණුවට පත් වුයේත් වැව නිසයි. එයට දාගැබ එක් වීමෙන් පසු සිංහල බෞද්ධ සංස්කෘතිය ඔපවත් විය. හෙළ හැදියාවේ අංග ලක්ෂණ එතුළින් දැක ගත හැකිය.***" වාරි සංස්කෘතිය තුළ ගොඩ නැගුණු චාරිත්‍ර වාරිත්‍ර ඇදහිලි විශ්වාස රැසකි. ඒ අතර *ජටාව, හිස්වැසුම් පැළඳ වැව වටේ යාම වැවට සිදු කරන අගෞරවයක් විය. පච්චවඩම් නැතහොත් රක්තපැහැ ඉන හැඳ පැළඳ ගෙන තොවිල්, ශාන්ති කර්ම හා දේව පූජා පවත්වමින් වැව් බැම්ම උඩින් ගමන් කිරීම නොකට යුත්තකි. පුණ්‍ය*

*තෙනාවෙන් ආශිර්වාද ලද වැව් දියවර දෘෂ්ටිවාදය හා ඇදහිලිවලින් කිලිටි විය යුතු නැත. රංචු වැකන්ද මතින් ගමන් කිරිම වැව් බැම්ම බිදී යාමට හේතු වෙයි. නොයෙන ගමන් යාම හෙවත් මල මිනිසකු වැව් බැම්ම මගින් ගෙනයාම වැවට කරනු ලබන අගෞරවයකි.* මෙලෙස වාරි කර්මාන්තය හා බැදි සංස්කෘතියක් එකල පැවතුණි. ඊට අමතරව වාරි කර්මාන්තයෙන් ලැබුණු ආදායම් ආගමික මධ්‍යස්ථාන වෙත පුජා කිරිම සිදු වූ බව මූලාශ්‍රගත තොරතුරුවල වේ. නිදසුනක් ලෙස ඇළහැර ඇළ ඉදිකිරීමෙන් ලැබුණු ආදායම රජු විසින් ***"තිස්සවඩ්ඪමාණක"*** ප්‍රදේශයේ ආරාමයකට පුජා කළ බව වැඩිදුරටත් මහාවංසයේ සදහන් වේ. මෙලෙස ආගම දහමට ලැදි සමාජයක් ලගා කර ගරනීමට අනුරාධපුර යුගයේ වාරි කර්මාන්ත ඉවහල් වූ බව පැහැදිලි වේ. වාරි සංස්කෘතිය කෙමෙන් කෙමෙන් වර්ධනය වත්ම සමාජ සංවර්ධනය කෙරෙහි බලපානු ලැබීය. සමාජ සංවර්ධනය හා වාරි කර්මාන්ත අතර සබදතාවය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ***"වැවයි දාගැබයි ගමයි පන්සලය"*** සංකල්පය ඉතා වැදගත් වේ. වැව් පෙළෙහි එක් පසක කුඩා කඳු ගැටයක් හෝ උස් බිමක් ආශ්‍රිතව පන්සලක් තිබිම සුලභ දසුනකි. පන්සලේ දාගැබ වැව් ඉස්මත්තට හෝ කෙත් යායට පෙනෙන අයුරින් ඉදි කිරිම ද ඇතැම් විට දැකිය හැකිය. බෞද්ධ ජන පදනමක් සහිත ආදි වාරි කර්මාන්තය තුළ එහි පන්සලයි, වැවයි, දාගැබයි සංකල්පය බිහි වන්නේ මේ නිසාය. ඇතැම් තැන් වල වැව් තාවුල්ලේ කට්ට කපා ගඩොල් පුලුස්සා ඒවායින් දාගැබ් ඉදි කර ඇති බව ද දැක ගත හැකිය. ආගමික සහජීවනයද ගම්මානයේ වැසියන්ගේ රැස්වීම් ද දක්නට ලැබේ. ඒ තුළ ගැටළුවක් හෝ උවදුරක් පැමිණි විට පිහිට පතන ස්ථානයද පන්සලයි. මේ අනුව මිනිස් හැසිරීම්, කෘෂි කටයුතු, ආගමික කටයුතු, සංස්කෘතික කටයුතු සියල්ල වාරි කර්මාන්තය හා සම්බන්ධතාවයක් ඇත.

අවුරුදු 2500 ක දීර්ඝ අතීතයකට මෙන්ම මහා සංස්කෘතියකට ද උරුමකම් කියන අතීත ශ්‍රී ලංකේය සංස්කෘතියේ ප්‍රධාන සංකල්පයක් ලෙස *වැවයි දිගැබයි ගමයි පන්සලයි* සංකල්පය ඇති විය. මිනිසා ක්‍රමයෙන් ශිෂ්ටාචාර වන විට ගම නිර්මාණය විය. ආර්යයන්ගේ පැමිණිමත් සමග ගංගා ආශ්‍රිතව තම ජනාවාස පිහිටුවා ගත්හ. මේවා ග්‍රාම නමින් හැඳින්වේ. නිල්ල පිරුණු ගොයමින් ගම සුන්දර විය. හේන් ගොවිතැන ද අඩු වැඩි වශයෙන් පැවතුණි. දේවානම්පියතිස්ස රජු කළ සිදු වූ මහින්දාගමනය සමඟ මෙරට තුළ සංස්කෘතික පෙරළියක් ද සිදු විය. රටේ ප්‍රධාන ආගම බෞද්ධ ආගම විය. උතුරු ඉන්දියානු ගඟ සම්ප්‍රදායේ ආභාෂය ඇතිව දාගැබ් නිර්මාණය වීම මහින්දාගමනයත් සමඟ ආරම්භ විය. මෙරට ඉදි වූ ප්‍රථම දාගැබ ථූපාරාමයයි. ඉන් අනතුරුව ද විවිධ රජවරුන්ගේ කාළ තුළ දී ද මහා දාගැබ් ප්‍රමාණයක් ඉදි විය. දාගැබ් අසල භික්ෂුන් වහන්සේලාට වැඩ සිටීමට පන්සල් නිර්මාණය විය. මිනිසා පන්සල සමඟ මනා සම්බන්ධතාවයකින් කටයුතු කළහ. කෘෂි කර්මාන්තයන් ස්වංපෝෂිත කිරීමට අතීත රජවරු ගම්මාන අසල විශාල වශයෙන් වැව් නිර්මාණය කළහ. එකළ ජනයා ජීවත් කළේ ද වැව් ජලයයි. පන්සලයි වැවයි දාගැබයි යන කොටස එකිනෙකට බැදි පැවතුණි. මෙලෙස වැවයි දාගැබයි ගමයි පන්සලයි සංකල්පය සමඟ සමාජ සංවර්ධනයක් ඇති කිරීමෙහිලා වාරි කර්මාන්තය ඉවහල් විය.

අතීත වාරි ශිෂ්ටාචාර වල ජෛව හා අජෛව මානව හා සංස්කෘතික සියලු දෑ වැව කේන්ද්‍ර කොට ගෙන වාරි කර්මාන්තය පදනම් කර ගෙන සිදු ව තිබේ. එනම් වැව බිහි වූ හේතුවෙන් බොහෝ සම්පත් හා සබඳතා ඇති වූ බවත් වැවේ ක්‍රියාකාරිත්වය මත සියල්ල පාලනය වු බවත් බොහෝ අංගයන් එකිනෙක සබඳතා ගොඩ නැගීමට පදනම් වුයේ "වැව" ලෙසත් හඳුනා ගත හැකිය. පහත සටහනින් එය මනාව පැහැදිලි වේ.




වැවට ඉහළින් ඇති රක්ෂිතය විවිධ ශාක ගොන්නකින් සමන්විත විය. එය මානව සුභ සිද්ධිය සඳහා අග්‍ර මෙහෙයක් ඉටු කළ බව පෙනෙයි. සමාජ අවශ්‍යතා සඳහා මෙන්ම විවිධාකාරයෙන් ඉවහල්ව ඇත. ඉහත සටහනෙහි වන සියලු කටයුතු ,සංකල්ප වාරි කර්මාන්තය හා බද්ධ වී ඇත. එසේම සමාජ සංවර්ධනායට බෙහෙවින්ම ඉවහල් වන කරුණු කාරණා විය.

ඉහතින් පෙන්වා දුන් කරුණු සියල්ලෙන්ම පැහැදිලි වන්නේ අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනයට වාරි කර්මාන්තයන් බෙහෙවින් ඉවහල් වී ඇති බවයි.

**නිගමනය**

සංවිධානාත්මක අගනගරයක් වශයෙන් පණ්ඩුකාභය රජුගේ කාලයේ ආරම්භ වූ අනුරාධපුර නගරය අති උසස් පාලකයන් යටතේ පාලනය වී විනාශය කරා ළගා විය. මේ යුගය තුළ සමාජයේ සෑම අංගයකම එනම් දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා ආගමික යන සෑම අංශයක් පුරා විහිදී වර්ධනයක් හඳුනා ගත හැකිය. එමඟින් එකළ සමාජ සංවර්ධනය පිළිබඳව පැහැදිලි වේ. මෙවැනි සමාජ සංවර්ධනයක් අනුරාපුර යුගය තුළ ඇති කිරීමට වාරි කර්මාන්තයන් බෙහෙවින් ම හේතු වී තිබේ. ඉහත සඳහන් සියලු කරුණු වලින් ගම්‍ය වන්නේ වසර එක් දහස් හාරසීයකට ආසන්න කාලයක් සිංහල රජධානිය වශයෙන් පාලනය වූ අනුරාධපුර යුගය තුළින් මනා සමාජ සංවර්ධනයක් මෙන්ම එවන් වාතාවරණයක් ඇතිවීමෙහිලා වාරි කර්මාන්තය විශාල වශයෙන් උපකාරී වී ඇති බවයි.

**පරිශීලන**

බ්‍රෝහියර්. ආර්. එල් (1999), ***බ්‍රෝහියර් දුටු ලංකාව***, පරි. ඒ හේවා වසම්, සූරිය ප්‍රකාශකයෝ, මරදාන.

ප්‍රසන්ජිත් පෙරේරා මුදිත, (2010***), ලාංකික වාරි උරුමය***, පරිසර යුක්ති කේන්ද්‍රය, කොළඹ

බස්නායක. එස්. ටී. (1997), ***පුරාතන ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, එම්. ඩී. ගුණසේන හා සමාගම.

විජිත මණුවර්ණ, ***ශ්‍රී ලංකාවේ වැව්***

ඩී. තුසිත මැන්දිස්, ***පුරාතන අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ ජල කළමණාකරණය***

සුරවීර, ඒ. වී. (2000), **අනුරාධපුර සංස්කෘතිය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.**

හංසනී දිල්හාරා, (2020), ***හෙළදිව වාරි සංස්කෘතිය***